ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2020 අප්‍රේල් මස 03 දින** |

## ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික තව දුරටත් අඩු කරයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2020 අප්‍රේල් මස 03 වැනි දින, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 6.00 සහ සියයට 7.00 දක්වා පදනම් අංක 25 කින් 2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන වෙලාවේ සිට බලපැවැත්වෙන පරිදි අඩු කිරීමට තීරණය කළේය. මෙම තීරණය මගින් වෙළඳපොල තත්ත්වයන් ලිහිල් කිරීම සඳහා දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහා සහයක් ලැබෙන අතර, කොරෝනා වෛරස (COVID-19) ගෝලීය වසංගතය මගින් සහ එය රට තුළ තවදුරටත් පැතිරයාම පාලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග මගින් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත දේශීය මූල්‍ය වෙළෙඳපොල මගින් තවදුරටත් සහන සැලසීමට අවකාශ ලැබෙනු ඇත.

**සටහන:** පෙර සැලසුම් කර තිබූ පරිදි 2020 අප්‍රේල් මස 09 වන දිනට නියමිත මුදල් ප්‍රතිපත්ති නිවේදනය සිදු නොවේ. එහෙත්, මුදල් මණ්ඩලය විසින් ආර්ථික හා වෙළඳපොල ප්‍රවණතා සලකා බලා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ඕනෑම විටෙකදී විවරණය කර අවශ්‍ය වෙනස් කිරීම් අදාළ පරිදි සිදු කරනු ඇත.